සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/08/01/චක්‍ර ලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2024.07.11 |
|---|---|---|---|---|---|

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2024/ 08

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.

**<u>සමෘද්ධි ප්‍රජා මූල බැංකු / බැංකු සමිති වලට අදාල අරමුදල් /පරිපාලන කටයුතු වෙනුවෙන් කරනු ලබන විධිමත් විනය පරීක්ෂණ සඳහා සහභාගී වන නිලධාරීන්ට දීමනා ලබාදීම.</u>**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල සේවය කරන ලබන නිළධාරියෙකු / නිලධාරීන් හා ග්‍රාම නිලධාරී වසම් භාර ( ක්ෂේත්‍රගත ) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමෘද්ධි බැංකු / බැංකු සමිති සතු මුදල් /අරමුදල් සම්බන්ධව සිදුකරන ලබන මුදල් වංචා , මුදල් අවභාවිතයන් හා අපහරනයන් කිරීම සම්බන්ධව කරනු ලබන විධිමත් විනය පරීක්ෂණ සඳහා සහභාගී වන නිළධාරීන්ට ගෙවියයුතු දීමනාවන් , සමෘද්ධි බැංකු / බැංකු සමිති අරමුදල් වලින් ගෙවීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරණ මණ්ඩල තීරණ අංක 2024/130/01 මගින් අනුමැතිය ලබාදී ඇත.

02.පරීක්ෂණය හා දීමනාවන් ගෙවීම.

| පරීක්ෂණය | දිමනාවන් ගෙවිය යුතු නිලධාරීන් | ගෙවිය යුතු දීමනාව |
|---|---|---|
| 01.විධිමත් විනය පරීක්ෂණය | 1. පරීක්ෂණ නිලධාරියා<br>11. පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා<br>111.රැකවරණ නිලධාරියා<br>1V.යතුරු ලේඛණ/පරිඝණක ක්‍රියාකරු<br>V. භාෂා පරිවර්තන ගාස්තු | • සංයුක්ත දීමනාව හා ගමන් වියදම් දීමනාව<br>• පරීක්ෂණ ගාස්තු<br>• ලිපිලේඛණ සකස් කිරීමේ ගාස්තු - (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛණ අංක 18/2018 ට අනුව )<br>• තැපැල් ගාස්තු |

03. විනය පරීක්ෂණ සඳහා සහභාගී වන නිලධාරීන් විසින් දීමනාවන්ට අදාල වවුචර් සකස් කර, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කර සමෘද්ධි බැංකු / බැංකු සමිතියට යොමු කිරීම සිදු කල යුතුය.
ඉන් අනතුරුව සමෘද්ධි බැංකු / බැංකු සමිතියට අදාල පරීක්ෂණයක්ද ? යන්න තහවුරු කරගෙන පාලක මණ්ඩල / විධායක කමිටු අනුමැතිය / ආවරණ අනුමැතිය මත ගෙවීම් කල යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | wajira | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. දීමනාවන් ගෙවීම සඳහා ගිණුම් සටහන

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු**

වැය ගිණුම විගණන හා විමර්ශන ගාස්තු - හර - ( කේත අංකය - 2136 )

ජංගම ගිණුම - බැර

**සමෘද්ධි බැංකු සමිතිය**

වැය ගිණුම විගණන හා විමර්ශන ගාස්තු - හර - ( කේත අංකය - 6206 )

ජංගම ගිණුම - බැර

මෙම දීමනාවන් ගෙවීමේ දී චක්‍රලේඛයේ නම සඳහන් නිලධාරියාට , ඔහුගේ / ඇයගේ ඉතිරි කිරීමේ ගිණුමකට බැරවන සේ ලියන ලද චෙක්පතකින් පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය.

05. උක්ත අංක 02 ඡේදයට අදාල ගෙවීම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති මගින් සිදු කරනුයේ මූල්‍ය වංචා / අපහරණය / අවභාවිතාවන්ට අදාල විධිමත් විනය පරීක්ෂණ සඳහා පමණක් වන අතර අනෙකුත් විෂමාචාර සම්බන්ධයෙන් සිදු කරන විධිමත් විනය පරීක්ෂණ සඳහා ගෙවීම් පෙර පරිදි ප්‍රධාන කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් කාර්යාලයෙන් ගෙවීම් සිදුකරනු ලැබිය යුතුය.

06. විධිමත් විනය පරීක්ෂණ සඳහා කරනු ලබන ගෙවීම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති වලින් ගෙවීම් කරනුයේ 2024 ජූනි මස 01 දිනෙන් පසුව සිදු කරන ලද පරීක්ෂණ සඳහා පමණි. මෙහිදී සිද්ධිය / සිදුවීම , සිදුවූ දිනය නොසලකා කටයුතු කළ යුතුය. තවද මෙම චක්‍රලේඛ සඳහා වන ගෙවීම් චක්‍රලේඛය ඔබ වෙත ලැබී සතියක් (01) ඇතුලත ගෙවීමට චෙක්පත් නිකුත් කිරීමට වැඩ පිලිවෙලක් සකස් කල යුතුයි.

07. යම් කාරනාවක් සම්බන්ධයෙන් උපදෙස් හා පැහැදිලි කිරීමක් අවශ්‍යනම් ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් / විමර්ෂණ අංශයෙන් ලබාගත හැකි බව වැඩි දුරටත් දන්වමි.

සී.ඩී කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

.01 ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.

02 දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.

04 දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.- ( චක්‍රලේඛ අනුමත කර සමෘද්ධි බැංකු / බංකු සමිතිවලට යැවීම හා චෙක්පත් නැවතත් අදාල නිලධාරීන් වෙත ලබාදීමට විධිමත් ක්‍රමයක් සකස් කිරීමට. )

05. අධ්‍යක්ෂ ( විමර්ෂණ ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

06. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.

07. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.

08. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.

09. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.